ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම

REDECO

රැකියා අවස්ථා

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අනුබද්ධිත සමාගමක් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සහකාර ප්‍රමාණ සමීක්ෂක - ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනම (පිරිමි)

මූලික සුදුසුකම් : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද 'ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5' (NVQ Levl 5) ට නොඅඩු මට්ටමක පවතින, ප්‍රමාණ සමීක්ෂණ (Quantity Surveying) ක්ෂේත්‍රයට අදාළ නිපුණතා සහතිකයක් ලබා තිබීම හා අදාළ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය ආවරණය වන, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Professional Chartered Institute) මූලික මට්ටමේ (Foundation) හෝ ඇතුළත් වීමේ මට්ටමේ (Entry-Level) විභාගයකින් සමත් වී තිබීම හා ප්‍රමාණ සමීක්ෂණ (Quantity Surveying) විෂය ක්ෂේත්‍රය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (IND) සමත් වී තිබීම හා වසර තුනක (03) අදාළ පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගැවීම ක්‍රියාත්මක වනු ඇත.(2026.01.01 දිනට මූලික වැටුප රු.46,960/= + ජීවන වියදම් දීමනාව රු.17,800/= සහ සමාගමේ අනුමත අනෙකුත් දීමනා)

තාක්ෂණ නිලධාරී - ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනම (පිරිමි)

මූලික සුදුසුකම් : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන, අදාළ ක්ෂේත්‍රයට අදාළ NVQ මට්ටම 7, 6 , 5 (NVQ Level 7,6,5) ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම හා යම් සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, අදාළ සුදුසුකම ලබා ගැනීමෙන් පසු එම ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබීම.

වැටුප : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගැවීම ක්‍රියාත්මක වනු ඇත. (2026.01.01 දිනට මූලික වැටුප රු.65,633/= + ජීවන වියදම් දීමනාව රු.17,800/= සහ සමාගමේ අනුමත අනෙකුත් දීමනා)

වයස් සීමාව : අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට අදාළ රාජකාරි කාර්යක්ෂමව හා ආරක්ෂිතව ඉටු කිරීම, අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් කොටගල,හිඟුරක්ගොඩ,අම්පාර හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශ වල අයදුම්කරුවන් සඳහා විශේෂ වේ.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන, වෘත්තීය සහ සේවා පලපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ **2026/11/23** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම,

නො.28/10A, කිරිමණ්ඩල මාවත, නාවල රාජගිරිය.